# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 48 දරන ශ්‍රී ලංකා මෝටර් වාහන ඉංජිනේරු ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 නොවැම්බර් මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැක.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 48 දරන ශ්‍රී ලංකා මෝටර් වාහන ඉංජිනේරු ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 03 වන දින]

එල්.ඩී.—ඕ. 82/90

## ශ්‍රී ලංකා මෝටර් වාහන ඉංජිනේරු ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"ශ්‍රී ලංකා මෝටර් වාහන ඉංජිනේරු ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන ආයතනයක් ඒ ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, ඒ ආයතනයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්ය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබුණු හෙයින් ද :

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු එකී ආයතනය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී ආයතනය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1992 අංක 48 දරන ශ්‍රී ලංකා මෝටර් වාහන ඉංජිනේරු ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා මෝටර් වාහන ඉංජිනේරු ආයතනය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මෝටර් වාහන ඉංජිනේරු ආයතනයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා මෝටර් වාහන ඉංජිනේරු ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කිරීමට අරමුණු කොට ගත් පොදු පරමාර්ථ පහත දැක්වේ :—

(අ) ශ්‍රී ලංකාවේ මෝටර් වාහන ඉංජිනේරු වෘත්තියෙහි නිරත වන සියලු දෙනාගේ අර්ථ සිද්ධිය ආරක්ෂා කිරීම ;

(ආ) සංස්ථාවේ සාමාජිකයින් අතර මෝටර් වාහන ඉංජිනේරු විද්‍යාව විෂයෙහි වූ වෘත්තීය ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීම ;

(ඇ) මෝටර් වාහන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පිළිගත් සුදුසුකම් ලබා ගැනීමට සංස්ථාවේ සාමාජිකයන්ට ආධාර කිරීම ;

(ඇ) මෝටර් වාහන ඉංජිනේරු විද්‍යාවේ දියුණු තාක්ෂණ ක්‍රම පිළිබඳ දැනුම සහ දක්ෂතා ඇති කර ගැනීමෙන් එම විද්‍යාවේ නවීන සංවර්ධනය සමග පෙරට යාමට සාමාජිකයන්ට ආධාර වීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ මෝටර් වාහන කර්මාන්තයෙහි නිරත වන තැනැත්තන් සඳහා පුහුණු කිරීම් සහ වෙනත් පහසුකම් සැලසීම ;

(ඊ) ශ්‍රී ලංකාවේ මෝටර් වාහන ඉංජිනේරු විද්‍යාවේ තත්ත්වය නැංවීම හා උසස් තත්ත්වයක් පවත්වා ගෙන යාම ;

(උ) ශ්‍රී ලංකාවේ මෝටර් වාහන කර්මාන්තය ප්‍රවර්ධනය කොට වැඩි දියුණු කිරීම ;

(ඌ) ශ්‍රී ලංකාවේ හා විදේශවල පිහිටි සමාන පරමාර්ථ දරන සංගම් සමග සම්බන්ධකම් ඇති කිරීම, වර්ධනය කිරීම හා පවත්වාගෙන යාම ;

(එ) මෝටර් වාහන ඉංජිනේරු විද්‍යාව හා සම්බන්ධ ජාත්‍යන්තර මණ්ඩල සමග සම්බන්ධකම් ඇති කිරීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම ;

(ඒ) මෝටර් වාහන ඉංජිනේරු විද්‍යා වෘත්තියෙහි නිරත වන සියලු තැනැත්තන් සඳහා වෘත්තීය ආචාර ධර්ම සංග්‍රහයක් පිළියෙල කිරීම ;

(ඔ) සංස්ථාවේ සාමාජිකයන් අතර සහෝදරත්වය ප්‍රවර්ධනය කිරීමට තුඩු දෙන ක්‍රියාකාරකම් බිහි කිරීම.

"මෝටර් වාහන ඉංජිනේරු විද්‍යාව" යන්නට, මෝටර් වාහන සැලසුම් කිරීමට, නිෂ්පාදනය කිරීමට හෝ නඩත්තු කිරීමට සම්බන්ධ සියලු ඉංජිනේරු අංශ ඇතුළත් වේ.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම, සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීම හෝ එකතු කිරීම, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් උන්නතියට පත් කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් සමන්විත සභාවක් විසින් ඒ රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන ආයතනයේ සභාව, සංස්ථාවේ ප්‍රථම සභාව විය යුතු ය.

**සංස්ථාවේ රීති.**

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම, සාමාජිකයන් වර්ග කිරීම හා රැස්වීම්වලදී ඡන්දය දීමට ඔවුන්ගේ හිමිකම, නිලධරයන් සහ සභාව තෝරා පත් කර ගැනීම, සංස්ථාවේ, සභාවේ සහ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටුකිරීම, සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා, සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක ඡන්දයෙන් මේ පනතේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමකදී එවැනි ම ආකාරයෙන් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**ආයතනයෙන් ගෙවිය යුතු සහ ආයතනයට අයවිය යුතු ණය.**

7. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේදී ආයතනය විසින් ගෙවිය යුතුව තිබුණු සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට ආයතනයට අයවිය යුතු සියලු ණය සහ ආයතනයට ගෙවිය යුතු සියලු සාමාජික මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**දේපළ දැරීමට සංස්ථාව සතු බලය.**

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, බදු දීමක් ප්‍රකාර හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව වෙත සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ දැරීමට නීතියෙහි ලා සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට හෝ බැඳීමකට යටත් කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

9. සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයාගේ ආරක්ෂා භාරයේ තිබිය යුතු ය. තවද සභාව විසින් අනුමත කරනු ලබන යෝජනා සම්මුතියක බලය පිට සහ සභාව විසින් නම් කරන ලද නිලධරයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව තබනු නොලැබිය යුතු අතර ඒ නිලධරයන් විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

10. සංස්ථාවේ සාමාජිකයකුගෙන් සංස්ථාවට සාමාජික මුදල් වශයෙන් අය විය යුතු මුදලට වැඩි දායක මුදල් කිසිවක් සංස්ථාවේ ණය හා බැරකම් පියවීමේ හෝ වෙනත් කාර්ය සඳහා ගෙවීමට සංස්ථාවේ කිසිම සාමාජිකයකු යටත් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මඟින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 255 බෞද්ධාලෝක මාවත කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.